ගීයක් රසිකයින් අතරට රැගෙන යාමේදී වාහකයා වන්නේ එම ගීය ගායනා කරන ශිල්පියා හෝ ශිල්පිනියයි. බොහෝ විට ගීයේ නිර්මාතෘවරුන් දෙදෙනා වන ගීත රචකයාත්, සංගීත හා තනු නිර්මාපක-යාත් සැඟවී යනවා. එහෙත් ගීතයේ අර්ථය හෝ පසුබිම සොයා යැමේදී වඩාත් වැදගත් වන්නේ ගීයේ නිර්මාතෘවරුන්. එහිදීයි ඔවුන් ඉදිරියට ගෙන ආ යුතු වන්නේ. ''ගී සඳළුව'' වඩාත් උත්සාහ කරන්නේ ගීයක පසුබිම පිළිබඳව සොයා බැලීමටයි.

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර වෙසෙන චන්ද්‍රසේන රංගේ ප්‍රවීණ ගේය පද රචකයාණන්ව සම්බන්ධ කර ගැනීමට කාලයක පටන් පැවැති අවශ්‍යතාවය මල්පල ගන්වා ගන්නට ''ගී සඳළුව'' පසුගියදා සමත් වුණා.

සිසිර දිසානායක

ශිල්පී පුන්සිරි සොයිසා ගැයූ ''නොහඬන් ළඳුනේ'', ''සුභා කියා මා ඔබ අමතන්නද?'', මහාචාර්ය අමරා රණතුංග ගැයූ ''රාධා ක්‍රිෂ්ණා'', ''චුටි මගෙ දුව චූටි'', ආචාර්ය දයාරත්න රණතුංග ගැයූ ''මල් පිපිලා'' ශිල්පී වික්ටර් රත්නායක ගැයූ ''ජීවිතේ තුරුණු වසන්තේ'', ශිල්පී විල්බට් ඇන්තනී ගැයූ ''නොහඬන් මියුලැසියේ'' වැනි ජනප්‍රිය ගීත රැසක් රචනා කළ චන්ද්‍රසේන රංගේ සමඟින් ගෙවුණ හෝරාව ගීත රචකයකුගේ අත්දැකීම් ඇසුරින් ගීය පිළිබඳව කෙරුණා වූ වැදගත් කතිකාවතකින් සපිරුණා.

මහාචාර්ය අමරා රණතුංග හඬින් ගැයුණු ''ඊයේ රෑ ඔබ සිහිනෙන් දෙඩවූ ඒ උපුලි කවුදෝ'' ගීතය මාතෘකා කොට මුල පිරුවඳ රංගේ ගේ අදහස් සියලුම ගීත රචනාවන් සඳහා පොදු ඒවා වූවා.

''මේ ගීතය මම ලිව්වේ මිට අවුරුදු තිස් පහකට විතර කලින්. ඒ කියන්නේ හැත්තෑවේ දශකයේ. කවුරුත් දන්නවානේ ඒ කාලයේ සරු නිර්මාණ බොහොමයක් නිර්මාණය වුණ බව. ඉතින් ඔය රැල්ලේ අසිත් හිටියා. හුගදෙනෙක් අහන ප්‍රශ්නයක්නෙ ඔය ගීත ලියන්නේ කොහොමද කියලා. ඒ දවස්වල මගෙනුත් ඔය ප්‍රශ්නය ඇහුවා. මොකද මම නාරද දිසාසේකර, ගුණදාස කපුගේ වගේ අය හිටියේ ගුවන් විදුලියේ ඉංජිනේරු අංශයේනේ.'' චන්ද්‍රසේන රංගේ එවකට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉංජිනේරුවරයෙක්.

කලාව හදාරලා නොතිබුණ අය කොහොමද මේ කලා කටයුතු කරන්නේ කියන එක අනිත් අයට හැමදාමත් ප්‍රශ්නයක්. නිර්මාණකරණය කියන දේ ශිල්පීය ඥානය ප්‍රගුණ කළ නිසාවෙන්ම කරන්නට බැරි දෙයක්. අනික අපේ අධ්‍යාපන ක්‍රමයේ නිර්මාණශීලී කෙනෙකුගේ ඒ හැකියාවන් ඉදිරියට ගන්න ක්‍රමයක් ඇතුළත් වෙලා නෑ. ඒ නිසා තමන් සහජයෙන් ලබපු දෙයක් තමන්ගේ උනන්දුව නිසා පොත පතින් හරි සමාජ ආශ්‍රයෙන් හරි වැඩි දියුණු කර ගත්තම ඒක සහතික ලබා ගන්නා අදහසින්ම ලබාගත් දැනුමට වඩා ප්‍රබල වෙනවා. ඉතින් මම අර මුලින් අහපු ප්‍රශ්නයට ඒ කාලයේ උත්තර දුන්නෙ මේ විදියට. ''සින්දු'' ලියනවා නෙවෙයි, ''ලියවෙනවා'' කියලයි. ඒත් ඇත්තටම අපිට අභියෝගයක් තිබුණා. ඒ තමයි ඉංජිනේරු අංශයේ දේවල් හදාරපු අය විදිහට හොඳ කලා නිර්මාණයක් කරන්න පුළුවන්ද කියන අභියෝගය. ඒ අභියෝගය හොඳින්ම ජය ගත්ත කෙනෙක් තමයි නාරද'' නාරද දිසාසේකර මෙන්ම ගුණදාස කපුගේ ශිල්පීන් පිළිබඳව මෙහිදී විශේෂයෙන් හඳුන්වා දිය යුතු නොවේ.

''ඒත් ඉබේට ලියවෙන ගීතයකින් විතරක්ම අපට තිබුණ අර අභියෝගය ජයගන්න අමාරු දෙයක් වෙනවා. ඒ නිසාම අපි උනන්දු වුණා පොතපත පරිශීලනය කරන්නත්, තමන් දැනගත් දේ අනික් අය එක්ක බෙදාහදා ගන්නටත්. ඉතින් නිරායාසයෙන්ම අපිට ''ලියවෙන'' සින්දුවලින් විතරක් සැඟිලකට පත් නොවී හරවත් දේ ඇතුළත් කරලා සින්දු ''ලියන්නත්'' සිද්ධ වුණා.

ඒ දවල්වල ඉන්දියාවේ පළවුණ සඟරාවක ලිපි පෙළක් පළවුණා ආසියාතික කාන්තාව ගැන. මේ ලිපිවලින් කියවුණ විදියට ආසියාතික ගැහැණියගේ ආදරය ප්‍රබලයි. ගැහැණියගේ ආදරය සෘජුයි. නොවෙනස් වෙන සුළුයි. ඒක පිරිමින්ගේ ආදරයට වඩා ගැඹුරුයි. ඒකට ඉතින් මනෝවිද්‍යාත්මක හේතු තියෙනවා. ඒ කාලයේ ආසියාතික කාන්තාව රැකියාවල

නියුතු වුණේ අඩුවෙන්. ඉතින් තමන්ගේ සැමියා මත යැපෙන්නට සිද්ධ වුණා. මෙතෙන්දි තමන්ගේ ආරක්ෂාව, රැකවරණය වගේම අනාගතය ගැන ඇතිවෙන මනෝභාවයන් නිසාම ඇය ආදරයට ගෞරවයෙන් සළකනවා. මොකද සියලුම දේ රඳාපවතින්නේ ඒ මත නිසා. සිතේ සැකය වැඩිවෙන්නෙත් ඒ නිසාමයි. සුළු දෙයින් පවා සැළෙන්නේ ඒකයි.''

''ගුවන් විදුලියේ ඉන්න කාලයේ අපේ සහෘදයෝ කීපදෙනෙක් හිටියා මේ වගේ දේවල් කතා කරන්න එකතු වෙන. වැඩ අරුණාට පස්සේ පොඩි මිචිතකින් දෙතොල් තෙමන ගමන් කරන කතාවලදී ආදරය, කාන්තාව කියන දේවල් අපිට කාලීන මාතෘකා වුණා. මොකද අපි ඒ කාලෙ විවාහ වෙලා හිටියෙත් නෑනෙ. ආදරයට අර්ථකථන දෙන එක තමයි ඉතින් අපේ වැඩේ.''

''කවුද ඉතින් ඔය සහෘද පිරිස?''

ඊයේ රෑ ඔබ හීනෙන් දෙඩ වූ
ඒ උපුලි කවුදෝ?
නිදි නැති රෑ යාමේ මා හැඩවු
ඒ උපුලි කවුදෝ?

නෑ සියෙකුදු නෑ -
යෙහෙළියෙකුදු නෑ
දන්නා තරමින් කවරෙකු හෝ නෑ
අප වෙනුවෙන් ඔබ ඩා බිඳු හෙළනා
අට හෝරාවේ ඔබ හද යා වුණ
ජීවමාන ලියතඹරාවක්දෝ
ඒ උපුලි ?

උපුලි උපුලි - ආදර උපුලි
එළිවෙනතුරු ඔබ දෙඩුවා මතකයි
පුතු සමඟින් මහමඟට බසින්නට
හයංකාරයේ මග හෙළි පෙන්වන
මනමෝහන වූ සළෙල ලියක් දෝ
ඒ උපුලි.... ...

''ඒ හිටපු අය අතරින් මට මතකයි රොස්මන්ඩ් සේනාරත්න, දේවේන්ද්‍ර වීරසිංහ, වින්සි පෙරේරා, නාරද දිසාසේකර, සෙනරත් ජයවර්ධන වගේ අය. සෙනරත් කියන්නේ දැන් ක්‍රිකට් කණ්ඩායමේ නායක මහේල ජයවර්ධනගේ පියා.''

''ඉතින් අර මං කියවපු අදහසුත් මේ හිතවතුන් එක්ක හුවමාරු වුණ අදහස් උදහස් වලිනුත් ඔපමට්ටම් වෙලා තමයි ''උපුලි'' ගීතයේ ආකෘතිය නිර්මාණය වුණේ. ඔකට අපි සේවය කරපු මාධ්‍ය ආයතනයේ තිබුණ පරිසරයත් හරියට බලපෑවා.

විශේෂයෙන්ම ගුවන් විදුලියේ සේවය කරපු කාන්තා පක්ෂයේ අයගේ අත්දැකීම් මේ ගීතය ගැහැණියකගේ අදෝනාවක් විදියට ලියවෙන්න ඒ දේවල් හේතුවුණා. ඒකේ ඉතින් යම්කිසි මිහිරියාවකුත් තියෙනවානේ.''

''තමන්ගේ සැමියා, හීනයෙන් දෙඩවූ ''උපුලි'' කවුද? මට මුලින්ම ලියවුණේ ''මනමෝහන කළ සළෙල ලියක් දෝ...'' කියලයි. එතකොට අදහස් වෙන්නේ තමන්ගේ සැමියාගේ සිත වසඟ කළ සළෙල ලියක්දෝ කියන එකයි. ඒත් පස්සේ ඒක ''මනමෝහන වූ...'' කියලා වෙනස් කළා. එතකොට කියවෙන්නේ තමන්ගේ සැමියාගේ රූපයෙන් සිත වසඟ වුණ සළ්ලාල ස්ත්‍රියක් ද කියලයි. එයින් ඉබේටම තමන්ගේ සැමියා ආකර්ෂනීය කෙනෙක් බව කියවෙනවා. ඒ වගේම තමන් එතරම් ආකර්ෂනීය නොවන බවත් හැඟවෙනවා. ඇත්තටම ඒක ගීතයේ අර්ථය ප්‍රබල කර ගන්න යෙදූ උපායක්. තත්ත්වය වඩාත් නරක අතට හරවා රසිකයාට යොමු කළාම නේද කම්පනය වැඩියෙන් දැනෙන්නේ?'' රංගේ දුරකථනයේ සිඩ්නි කෙළවරේ ඉඳන් හිනාවුණා.

හීනයේ දී ඇසුණ උපුලිගේ නමත් එක්ක බිරිඳගේ හිතේ ඇති වන සුරක්ෂිතභාවය ගැන බයත්, සැමියාගේ හා උපුලිගේ ආකර්ෂනීය භාවයන් ගැන ඊර්ෂ්‍යාවන් තමන්ගේ ගෞරවාන්විත ප්‍රේමය දෙදරා යාම ගැන ඇතිවුණ ඉච්ඡාභංගත්වයත් යන කාරණා තුන ගීතයේ ආකෘතියේ ප්‍රධාන අංග තුන විදියට පෙළගැස්සුණා. මේ සිතුවිලි මුල්කරගෙන ඇතිවන හීනමානය රචනාව පුරාම දැනෙන විදියටයි මට ගීය සම්පූර්ණ කරන්න උත්සාහ කළේ. මේ වගේ නිර්මාණයක් කරන කොට කීපවතාවක් ලියලා, පිරිසිදු කරලා ඔපමට්ටම් කර ගන්න වෙනවා.

සැකය, බිය, ඊර්ෂ්‍යාව කරුණු තුන මුල් කරගෙන ආකෘතිය හැදුවාට ඒක ශ්‍රාවකයාට දැනෙන්නේ ඕන ''ඇයි මේ'' කියලා. ''නෑ සියෙක්, යෙහෙළියෙක් හරි වෙනත් දන්නා හඳුනන කෙනෙක් ඒ නමින් නැත්නම් අපි වෙනුවෙන් මගන්සි වි රාජකාරිය කරනා තැන සුරූපියක්ද මේ? ලියතඹරාව කියන්නේ නාරිලතා මල කියලත් හඳුන්වන හිමාලයේ පිපෙන මල් වර්ගයක්. මේ මල්වල හැඩය නග්න ස්ත්‍රියකට සමානයි. තපස් දම් රකින තාපසයින්ගේ පවා සිත් රාගයෙන් උමතු කරවන මලක් ලියතඹරා මල.'' තමන් වෙනුවෙන් වෙහෙස වෙන සැමියා ගැන කියන කොට බිරිඳට රැකියාවක් නැති වග ඉබේටම කියැවෙනවා. ඒ කියන්නේ ඇයට රැකවරණයක් නෑ වෙන.

පුතු සමඟින් මහ මඟට බසින්නට සිදුවෙයි ද කියන බය ඇති කරවන, ඒ පාරට බසින මඟ එළි කර පෙන්වන සළ්ලාල ස්ත්‍රියක්ද ඒ උපුලි? පද පෙළින් තමන්ගේ අනාගතය ගැන ඇති අවදානම් සිතුවිල්ල කියවෙනවා. තමන්ට පුතකුද ඉන්න නිසා ඒ අවදානම තවත් වැඩිකරලා පෙන්වන්නයි මම උත්සාහ කළේ. ජීවමාන ලියතඹරාවක්ද කියලා අහන්නේ තමන්ටත් වඩා සුරූපියක්ද කියන ඊර්ෂාවත් පෙරදැරි කරගෙන.''

රංගේ තමන්ගේ උත්සාහය පැහැදිලි කළා. සැබැවින්ම සාර්ථක උත්සාහයක් නොවෙයිද මේ? සැබැවින්ම ගී පද රචනයකදී නිබන්ධකයා විනාඩි තුනක පමණ කාලයකට ගොනු කරනා පද කීපයකින් පද දහස් ගණනක් පවා කියා නිම කළ නොහැකි දේ කියන්නට උත්සාහ ගනියි. අරුත් සුන් පදවැල් ලියාගෙන තමන්ම තමා ගීත රචකයෙකු යැයි හඳුන්වා ගන්නට ප්‍රයත්න දරන සුහුඹුලන්ට කදිම නිදර්ශනයක් නොවේද චන්ද්‍රසේන රංගේ නිබන්ධකයාණන්ගේ ''උපුලි''?

චන්ද්‍රසේනයන් සමඟින් ගෙවුණ හෝරාව නිමාවේ. දුරකතනයේ මෙල්බර්න් කෙළවරේ සිට කෘතවේදීව සමුගත්තා ''සන්නස'' .

LATROBE TAXATION SERVICES

14 DAY TAX REFUNDS

INDIVIDUAL RETURNS
$65

BAS/IAS and BUSINESS TAX RETURNS

LATROBE TAXATION SERVICES
REGISTERED TAX AGENT AND ACCOUNTANT

CONTACT
MALA: 94708241 OR 0401000421
Email: latrobetax@yahoo.com.au